# සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ



## තරුණ ස්ත්‍රීන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ සවිබලගැන්වීම සඳහා වන මොඩියුලය

# සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ

## තරුණ ස්ත්‍රීන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ සවිබලගැන්වීම සඳහා වන මොඩියුලය


ප්‍රකාශනය

WMC
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**

නො. 56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 8.
දුරකථන: +94-11-2690201; ෆැක්ස්: +94-11-2690191/2690201
ඊ මේල්: wmcsrilanka@gmail.com
වෙබ් අඩවිය: www.womenandmedia.org
මුහුණුපොත: facebook.com/womenandmediacollective
ට්විටර්: twitter.com/womenandmedia
යූ ටියුබ්: Women and Media Collective

අනුග්‍රහය

Norwegian Embassy
*Colombo*

දේශපාලන පක්ෂවල තරුණ ස්ත්‍රීන්ගේ හැකියාවන්
වඩා ශක්තිමත් කිරීම සඳහා වූ පුහුණු අත්පොත
**''සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ''**

**ප්‍රථම මුද්‍රණය** : 2020 ඔක්තෝබර්

සංකල්පය, දත්ත රැස් කිරීම සහ පර්යේෂණ ආකෘතිය:
**© කාන්තාව හා මාධ්‍ය සාමූහිකය**
ISBN 978-955-1770-38-9

**දත්ත විශ්ලේෂණය සහ පුහුණු අත්පොත සකස් කිරීම**
: සංජීවනී රූපසිංහ

**පිටු සැකසුම සහ කවර නිර්මාණය**
: පාලිත තේනුවර

**කවරයේ චිත්‍රය** : චරිත දිසානායක

**සම්බන්ධීකරණය** : වයලා පෙරේරා

**ප්‍රකාශනය** :
WMC
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
නොః 56/1, සරසවි පටුමග,
කාසල් වීදිය, කොළඹ 08.

**මුද්‍රණය** : සුමේධ කාරියවසම්
RSK HOLDINGS ප්‍රින්ටර්ස්

# පටුන


| | පිටු අංකය |
|---|---|
| ▸▸ පෙරවදන | 5 - 8 |
| ▸▸ ස්තුතිය | 9 - 10 |
| ▸▸ මෙම මොඩියුලයේ දළ සැකැස්ම | 11 - 13 |
| ▸▸ 1. හැඳින්වීම | 15 - 27 |
| ▸▸ 2. ඔබ ඔබටම කැටපතක් වන්න | 29 - 38 |
| ▸▸ 3. බාධක බිඳලමු | 39 - 44 |
| ▸▸ 4. නායිකාවක වන්න | 45 - 63 |
| ▸▸ 5. අනුකම්පාව වෙනුවට සහකම්පනය | 65 - 71 |
| ▸▸ 6. අරමුදල් සපයා ගන්න | 73 - 80 |
| ▸▸ 7. ලංකාවේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරමු | 81 - 95 |
| ▸▸ උපග්‍රන්ථය 1 | - 96 |
| ▸▸ උපග්‍රන්ථය 2 | 97 - 98 |
| ▸▸ උපග්‍රන්ථය 3 | 99 - 100 |



# පෙරවදන

## සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ...

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳ විමසීමක් කර බැලීමේ දී ඉතිහාසය පුරාම ක්‍රියාකාරී දේශපාලනය තුළ ස්ත්‍රීන්ට හිමිවූයේ අඩු සැලකිල්ලකි. 1931 දී ප්‍රථම වරට ඡන්ද අයිතිය ලබාගත්තේ ද ස්ත්‍රීන් විශාල සටනක් කිරීමකින් පසුව ය. විශාල අරගලයක් තුළ ඡන්ද අයිතිය ලබාගත් නමුත් එදා සිට මේ දක්වාම වසර 89කට ආසන්න කාලයක් ගතව ඇතත්, ජාතික, පළාත් හා ප්‍රාදේශීය දේශපාලන තලයේ ද ස්ත්‍රීන්ගේ නියෝජනය පිළිබඳව කිසිසේත් සෑහීමකට පත්විය නොහැකි ය. තවමත් අප රටේ පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 5%ට වඩා වැඩිවීමක් සිදුව නැත. එය පළාත් සභාවල 4%කි. 2017 දක්වාම පළාත් පාලන ආයතනවල නියෝජනය වූයේ 1.7%ක් පමණි. 2018 පළාත් පාලන මැතිවරණයේ දී ස්ත්‍රීන් සඳහා 25% කෝටාව ලැබීමත් සමගම එය 23% දක්වා වැඩිකර ගැනීමට හැකියාවක් ලැබුණි.

ජාතික දේශපාලනය තුළ පාර්ලිමේන්තුවට තේරී පත් වූ ස්ත්‍රීන්ගෙන් වැඩිදෙනෙක්ම නාගරික ප්‍රභූ පාන්තික පවුල්වලට අයත් යම් දේශපාලන පවුල් පසුබිමක් මත දේශපාලනයට පිවිසි අය වීම සුවිශේෂී කරුණකි. මෙම ස්ත්‍රීන් දේශපාලනයට පිවිස ඇත්තේ තම පවුලේ සීයා, පියා, සොහොයුරා හෝ ස්වාමියාගේ ඇවෑමෙන් පසුවය. තමාගේම නායකත්වයක් ඔස්සේ ස්වාධීනව දේශපාලනයට පිවිසි අය අවම සංඛ්‍යාවක් බව පෙනී ගිය කරුණකි.

නමුත් නිදහස ලැබූ මුල් කාලයේ සිට '70 දශකය දක්වා කාලය තුළ ජාතික දේශපාලනයට පිවිසි ස්ත්‍රීන්ගෙන් බොහොමයක් දෙනා වෘත්තීය සමිති හෝ පළාත් පාලන

දේශපාලනයට සම්බන්ධ වූ වාමාංශික දේශපාලන අත්දැකීම් සහිත අය වීම සාධනීය කාරණයක් වන්නේය.

අදවන විට සමස්ත පොදු දේශපාලන ක්‍රියාවලිය තුළ, විශේෂයෙන් දේශපාලන පක්ෂ තුළ සාමාජිකත්වය, කාන්තා බලමණ්ඩල, මැතිවරණ කටයුතු සහ මැතිවරණ උද්ඝෝෂණවල දී කැපී පෙනෙන ලෙස ස්ත්‍රී සහභාගිත්වයේ හා ක්‍රියාකාරිත්වයේ වර්ධනයක් දක්නට ඇත. ඒ තුළ තරුණ ස්ත්‍රීන්ගේ සහභාගිත්වය ධනාත්මක ලෙස වර්ධනය වී ඇත. එය මෙම ''දේශපාලනයේ ස්ත්‍රී නියෝජනය'' පිළිබඳ දක්නට ලැබෙන යහපත් ප්‍රතිඵලයක් වුවත්, පක්ෂ අභ්‍යන්තරයේ තීන්දු තීරණ ගන්නා ව්‍යුහයන් තුළ ඔවුන්ගේ නියෝජනයේ අඩුවක් දක්නට ලැබේ.

ලොව ප්‍රථම අගමැතිනිය ලෙස 1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අග්‍රාමාත්‍ය ධූරයට පත්වුවත්, 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විධායක ජනාධිපතිනිය ලෙස පත්වුවත්, දේශපාලනය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සෑහීමකට පත්විය නොහැකිය.

රටක පවතින දේශපාලන ක්‍රමය සාර්ථක වීමට නම් ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ සමාන නියෝජනයක් ඒ තුළ අනිවාර්යයෙන්ම තිබිය යුතුය. ඒ වගේම එම නියෝජනය සියලු ජනවාර්ගයන්ගේ සම්මිශ්‍රණයකින් යුක්ත වීමද ඉතා වැදගත් කාරණයකි.

මෙවැනි පසුබිමක් තුළ රටේ තීන්දු තීරණ ගන්නා ඉහළම ව්‍යුහය වන දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනයේ ඇති වැදගත්කම තේරුම්ගත් ''කාන්තාව හා මාධ්‍ය සාමූහිකය'' ලෙස අපි, දේශපාලනය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය වැඩි කිරීම සඳහා වූ කාර්යය ප්‍රවර්ධනය කිරීම සඳහා වසර 20කට වඩා වැඩි කාලයක් පුරා විවිධ ක්‍රියාකාරකම්වල නිරත වෙමින් සිටින්නෙමු. අප මෙන්ම රටේ වෙනත් ස්ත්‍රී සංවිධාන, සිවිල් සංවිධාන, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, පාර්ලිමේන්තු කාන්තා සංසදය, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හා මැතිවරණ කොමිසන් සභාව වැනි රාජ්‍ය ආයතනයත් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වෙමින් මේ කාර්යයට විශාල ලෙස දායක වී ඇත.

2017 අංක 16 දරණ පළාත් පාලන ඡන්ද නීති (සංශෝධන) පනත නීතිගත කරමින්, පළාත් පාලන ආයතන සඳහා ස්ත්‍රීන්ට

25%ක කෝටාවක් ලබා දීමට රජය පියවර ගනු ලැබුවේ ද අප සියලුදෙනා විසින් ගෙනයන ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙසය. එය අප සියලුදෙනා ලද විශාල ජයග්‍රහණයකි. මේ නිසා 2018 පැවති පළාත් පාලන මැතිවරණයේ දී එතෙක් පළාත් පාලන ආයතන තුළ 85ක් වූ ස්ත්‍රී නියෝජනය 1926 දක්වා වැඩිකර ගැනීමට අවස්ථාවක් ලැබුණි. එහෙත් මෙම 25% නියෝජනය ලබාදීමේ දී ක්‍රමවත් ආකාරයට තෝරා ගැනීම් සිදු නොවූ නිසා වසර ගණනාවක් දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීව කටයුතු කළ ස්ත්‍රීන් වැඩි පිරිසකට එම අවස්ථාව අහිමි විය.

එසේ නියෝජනය ලබාගත්තත් අදාල පළාත් පාලන ආයතන තුළ ඔවුන්ට ඉහළ තනතුරු සඳහා පත්වීමටත්, ස්ත්‍රීන් සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමටත් ඉඩකඩ නොමැති වී ඇත. ඒ තුළ ද ඔවුන්ට විශාල අභියෝග රැසකට මුහුණ දීමට සිදුව ඇත. එම අභියෝග ජය ගනිමින් ලබාගත් ජයග්‍රහණය යථාර්ථයක් බවට පත්කරගැනීම සඳහා කටයුතු කිරීමත්, පළාත් සභා සහ පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය වැඩිකර ගැනීම සඳහා කටයුතු කිරීමත් අප සියලුදෙනාගේම වගකීමක් සහ යුතුකමක් වන්නේය.

එබැවින් රටේ තිරසාර සමාජ, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ස්ත්‍රීන්ගේ දායකත්වය වර්ධනය කිරීම මෙන්ම ඒ හරහා සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරමින් නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමේ පරමාර්ථය ඇතිව තරුණ ස්ත්‍රීන් සියයක් දේශපාලන ක්‍රියාවලියට සූදානම් කිරීම මෙම වැඩපිළිවෙළෙහි ප්‍රධාන අරමුණ වේ.

එම අරමුණ ඉෂ්ඨ කරගැනීමට නම් අපි සියලුදෙනාම පක්ෂ භේදයකින් තොරව එකට එකතු වී සාමූහික ක්‍රියාවලියකට අවතීර්ණ වීමට කාලය එළඹ ඇත. දේශපාලනයේ ස්ත්‍රී නියෝජනය යථාර්ථයක් කරගත හැකි වන්නේ ඒ තුළයි.

රටේ තිරසාර සමාජ, ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට නම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සමානාත්මතාවයෙන් යුතු දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කළයුතුව ඇත.

දේශපාලනයේ නියැලෙන ස්ත්‍රීන්ගේ දැනුම වර්ධනය කරගැනීම පරමාර්ථය කර ගනිමින්, 2019 වසරේ අප විසින් ඔවුන්ගේම අත්දැකීම්වලින් සිදුකරන ලද සමීක්ෂණයක තොරතුරු

ඇසුරෙන් මෙම ''**සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ**'' නම් අත්පොත අපි එළිදක්වන්නෙමු. අපගේ පරමාර්ථය වනුයේ පිරිසිදු දේශපාලනයක් උදෙසා ස්ත්‍රීන් බල ගන්වමින්, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන් ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයකින් යථාර්ථයක් බවට පත්කිරීම ය.

**වයලා පෙරේරා,**
**ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරිනී,**
**කාන්තාව හා මාධ්‍ය සාමූහිකය.**

# අපේ ස්තුතිය...

''සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ'' නමැති මෙම අත්පොත, පුහුණු අත්පොතක් ලෙස සකස් කර නිමකිරීම සඳහා මූල්‍යමය දායකත්වය ලබාදුන් රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලයට (Royal Norwegian embassy) අපගේ හෘදයාංගම ස්තුතිය ප්‍රථමයෙන්ම පළ කරමු.

එමෙන්ම මෙම දේශපාලන ක්‍රියාකාරිත්වයේ සැබෑ ගමන් මඟ එළිපෙහෙළි කරන්නට වැඩමුළුවලට සහභාගී වෙමින් වැඩසටහන සාර්ථක කරගැනීමට ක්‍රියාකාරී දායකත්වයක් ලබාදුන් පළාත් පාලන ආයතනවල මන්ත්‍රීතුමියන්ට සහ පක්ෂවල තරුණ සාමාජිකාවන්ට ද අපගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමු.

එම කාර්යයේ දී දිස්ත්‍රික් මට්ටමේ සහ ජාතික මට්ටමේ සම්බන්ධීකරණ කටයුතු කරමින් වැඩසටහන සාර්ථක කරගැනීමට මහත් වෙහෙසක් දැරූ, මාතර - රුහුණු සිසිල සංවිධානයේ සභාපතිනි තිලකා වීරකෝන්, කුරුණෑගල - ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂිකා සුමිකා පෙරේරා, බදුල්ල - කාන්තා සංවර්ධන පදනමේ අධ්‍යක්ෂිකා චන්ද්‍රා වෙදගෙදර සහ ගාල්ල - ගැමි කාන්තා පෙරමුණේ සභාපතිනි ශ්‍රියානි පතිරගේ ත්‍රිකුණාමලය - විළිදූ සංවිධානයේ ප්‍රධාන වැඩසටහන් නිළධාරිනි ඉන්දුමතී හරිහරධාමෝදරන් යන සහෝදරියන්ගේ කැපවීම ගෞරවයෙන් සිහිපත් කරමු.

එමෙන්ම මහරගම මහ නගර සභාවේ චන්ද්‍රිකා ද සොයිසා, කෝට්ටේ මහ නගර සභාවේ ප්‍රියදර්ශනී ආරියරත්න, හර්ෂනී සමන්තිකා යන නාගරික මන්ත්‍රීතුමියන් සහ පක්ෂ ක්‍රියාකාරී සාමාජිකාවක් වන නිලූෂි පෙරේරා මහත්මියත් මෙම වැඩසටහන

සාර්ථක කරගැනීමට විවිධ අයුරින් ලබාදුන් සහයෝගය සිහිපත් කරන්නේ ඉතාමත් සහෝදරත්වයෙනි.

සියලුම වැඩමුලු වඩාත් ඵලදායී ලෙස සාර්ථක කරගැනීමට විශාල වෙහෙසක්, කැපවීමක්, මගපෙන්වීමක් කරමින් සම්පත් දායකත්වය සැපයූ සුමිකා පෙරේරා සහෝදරිය ද ඉතා ලෙන්ගතුව සිහිපත් කරමු.

පුහුණු වැඩමුලු මෙහෙයවීමෙන්, වාර්තාකරණයෙන් සහ පසු සියලු කටයුතු වඩා ඵලදායී අයුරින් නිමකර ගැනීමට විශාල දායකත්වයක් ලබාදුන් තුෂාරි මඩහපොල සහ වැඩමුලු වාර්තාකරණයෙන් සහ පුහුණු අත්පොතේ සෝදුපත් කියවා බලමින් නොමද සහයෝගයක් ලබාදුන් එඩ්නා මල්කාන්ති සහෝදරියන්ටද හෘදයාංගම ස්තුතිය පළ කරමු.

ඉහත කී වැඩමුලුවල දත්ත විශ්ලේෂණය සහ සමීක්ෂණයේ ප්‍රතිඵල රැස්කරමින් මෙය පුහුණු අත්පොතක් ලෙස සකස් කළ කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී සංජීවනී රූපසිංහ සහෝදරියට අපගේ ගෞරවනීය සහෝදරාත්මක ස්තුතිය පිරිනමමු.

කවරය සිතුවම් කළ සහෝදර චරිත දිසානායක සහ පිටු සැකසුම සහ කවරයේ සැකැස්ම සිදු කළ පාලිත තේනුවර සහෝදරවරුන් ලබාදුන් සහයෝගය සිහිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

සිංහල භාෂාවෙන් ලියැවුණු අත්පොත දමිළ බසට පරිවර්තනය කරදෙමින් මනා සබඳතාවයක් ගොඩනගා ගැනීමට වීරසිංහ සහෝදරයා කළ මෙහෙවර අප අගය කරනු ලබන්නේ ලබැදි සහෝදරත්වයෙනි.

පොත මුද්‍රණය කරදුන් RSK HOLDINGS ප්‍රින්ටර්ස් හි සුමේධ කාරියවසම් සහෝදරයා ඇතුලු කාර්ය මණ්ඩලයට අපගේ ස්තුතිය පිරිනමමු.

ඔබ සියල්ලන්ගේම සහාය නොලැබුණේ නම් මේ "**සියක් ස්ත්‍රීන් දේශපාලන පෙරමුණේ**'' අත්පොත පෙරමුණට ගත හැකි ද? ඉතින් ඔබලා නොවන්නට මෙය යථාර්ථයක් නොවන්නේම ය.

සැබැවින්ම ඔබ සැම අපට මහත් අත්වැලක්ම වූ බව හෘදයාංගවම සටහන් කරමු.

**කාන්තාව හා මාධ්‍ය සාමූහිකය**